**ගම්පහ මහා නගර සභාව - 2021**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

ගම්පහ මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගම්පහ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**මහා නගර** සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව **මහා නගර** සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ **මහා නගර** සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මහ නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැඩ අවසන් නොකරන ලද ව්‍යාපෘති 5 කින් 4 ක ඇස්තමේන්තු වටිනාකම රු.24,490,000 ක් කෙරීගෙන යන වැඩ ගිණුමද, ව්‍යාපෘති 1 ක ඇස්තමේන්තු වටිනාකම රු.1,897,200 ක් සාවද්‍ය ලෙස ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු ගිණුමද හර කර, රු.26,387,200 ක් ණයහිමි ගිණුම බැර කර තිබුණි. | පිළිගනිමි. 2022 වර්ෂයේ ගිණුම් වලින් ගැලපීමට කටයුතු කරමි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගණනය කරන ලද වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති වටිනාකම දේපල පිරියත හා උපකරණ ගිණුමටද, වැඩ අවසන් නොකරන ලද ව්‍යාපෘති වටිනාකම කෙරීගෙන යන වැඩ ගිණුමටද, හරකර සාවද්‍ය ලෙස හර කරන ලද වටිනාකම සමුච්චිත අරමුදල ගිණුමටද, මුළු එකතු වටිනාකම ණයහිමි ගිණුමටද බැර කර ශේෂයන් නිවැරදි කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් භාවිතා කරන පිරිවැය රු.3,843,725 ක් වූ කොහා සහ නෙක්ෆා යන මෘදුකාංග පැකේජ 2 හි පිරිවැය හෝ වර්තමාන වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී දේපල පිරියත හා උපකරණ වටිනාකම නිවැරදි කරමි. | |
| (ඇ) | ගබඩාවෙන් නිකුත් කර තිබුණු පාරිභෝගික භාණ්ඩ අයිතම 20 ක වටිනාකම රු.188,409 ක් දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. | දැනට දේපල පිරියත හා උපකරණ යටතේ හඳුනාගෙන ඇති තොග අයිතම 20, නිකුත් කිරීම් සිදුවී ඇති බැවින්, එහි වැය බර ජ'නල සටහන් මගින් ගැලපීම් කර නිවැරදි කර ගැනීමට වග බලා ගනිමි. | |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 03 කට අදාලව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ප්‍රතිපූර්ණය වියයුතු රු.136,305 කට අදාළ කර්මාන්ත ණය හිමි වටිනකම හා දේපළ, පිරියත හා උපකරණ ශේෂය රු.136,305 ගිණුම්ගත කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු වෙත ගෙවා නොමැති බැවින් ණය හිමි ලෙස වෙන් කරන ලදී. | නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (එ ) | 2021 වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම ගණනය කර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වෙනම දැක්විය යුතුය. එම ගණනය සඳහා සමාලෝචිත වර්ෂයේ අතිරික්ත වටිනාකම රු.181,048,126 ක් නොගැනීමත් අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.29,692,677 ක් ගැනීමත් හේතුවෙන් වසර සඳහා විස්තීර්ණ ආදායම රු.151,355,449 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමේදී වැරදී නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | |
| (ඒ ) | හිඟ කඩ කාමර කුලි රු.1,098,050 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | |
| (ඔ) | භාණ්ඩ ලැබීම් පත්‍ර අංක 909 යටතේ ගබඩාවට ලද රු.7,181,520 ක වටිනාකමැති භාණ්ඩ වෙනුවෙන්, 2020 මාර්තු 26 දිනැති වවුචර් අංක 68 මගින් සැපයුම්කාර ආයතනයට රු.6,985,500 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ සැපයුම්කාර ආයතනයට ගෙවිය යුතු ලෙස රු.7,181,520 ක් සාවද්‍ය ලෙස ණයහිමියෝ යටතේ ගිණුම් ගත කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | 2021 වර්ෂයේ ගෙවා අවසන් වියදම් සඳහා ණය හිමියන් ලෙස ඉදිරියේදී නැවත ගෙවීම් සිදුකළ නොහැක. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණයහිමි උපලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා රු.139,269,409 ක් වූ ණයහිමි ශේෂය සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | අදාල අංශ වලින් ලද ණය හිමි ශේෂ එකතුව විගණනයට ඉදිරිපත් කර ඇත. | කේවල ශේෂ උපලේඛන ඉදිරිපත් කළයුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවේ, මහ නගර සභා ආඥා පනතේ 185 සහ 186 වගන්ති සහ බස්නාහිර පළාත් සභාවේ මහ නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 25 | - | මහ නගර සභාවට ලැබෙන පරිත්‍යාග බැර කිරීම සඳහා ගම්පහ රාජ්‍ය බැංකුවක වෙනම ගිණුමක් ආරම්භ කර " නගරධිපති අරමුදල" නමින් වෙනම අරමුදලක් ස්ථාපිත කර තිබුණි. | බැංකු ගිණුමට අදාල තොරතුරු ගින්නෙන් විනශ වූ බව නගරාධිපතිතුමා විසින් ලිඛිතව දැනුවත්කර ඇත. | මහ නගර සභා ආඥා පනතේ 185 වගන්තිය ප්‍රකාරව විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | 371 | 691,745 | 2015 දෙසැම්බර් 08 දින නෙක්ෆා ඕස්ට්‍රේලියා ජාලගත කිරීම සඳහා හා 2018 ඔක්තෝබර් 09 දින වැටුප් අත්තිකාරම් ලෙස ලබාදෙන ලද එකතු වටිනාකම රු.682,745 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම 2 ක් 2022 ඔක්තෝබර් 04 දින වනවිටත් පියවා නොතිබුණි. | ඉංජිනේරු අංශයෙන් තොරතුරු සොයමින් පවතී. | අතුරු අග්‍රිම පියවීමට කටයුතු කළයුතුය. |
| (ii) | 571 (1) හා (2) | 31,187,813 | වර්ෂ 2 ක් ඉක්මවූ, කොන්ත්‍රාත් අතරුදවුම් තැන්පත් ශේෂ 172 ක වටිනාකම රු.13,427,498 ක් සහ විවිධ තැන්පතු ශේෂ රු.1,418 ක වටිනාකම රු.17,760,315 ක් නියාදනය කර නොතිබුණි. | එම තැන්පතු යලි සමලෝචනය කර මුදල් රෙගුලාසි 571 අනුව ආදායමට හඳුනාගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආපසු ගෙවීම හෝ ආදායමට ගැනීම කළ යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 880 හා පළාත් පාලන කොමසාරිස්ගේ 2004 ජූලි 09 දිනැති අංක LG/5/2004 දරන චක්‍රලේඛය | | මහා නගර සභාවේ ඇප තැබිය යුතු නිලධාරීන් 27 ක් සේවක ඇප තබා නොතිබුණි | ඇප තැබීම සඳහා නිලධාරීන් දැනුවත් කර තිබුණද, ඔවුන් ඇප තබා නොමැති අතර නැවත එම කටයුතු සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | අංක 2155/6 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 08 | | එක් එක් මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය, අනුගාමී මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය දින 106 ක් ප්‍රමාද වී එනම් 2022 ජුනි 15 දින ඉදිරිපත් කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ගැසට් පත්‍රයේ පරිදි මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර විගණනය වෙත ලබා දීම කළයුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

2.1. **මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.181,048,126 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.132,650,873 ක් විය.

2.2. **ආදායම් පරිපාලනය**

**-----------------------**

**ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය**

**---------------------------------------**

2.2.1. වරිපනම් හා බදු

-------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | ------------- |
| (අ) | 1946 තක්සේරුකරන ආඥාපනත ප්‍රකාරව සෑම වර්ෂ 5 කට වරක් වරිපනම් තක්සේරුවක් කළයුතුය. ගම්පහ මහා නගර සභාවේ, ගම්පහ කාර්යාලයේ සහ යක්කල උප කාර්යාලයේ වරිපනම් ඒකක පිළිවෙලින් 10665 ක් සහ 20892 ක් සඳහා පිළිවෙලින් 2011 හා 2005 යන වර්ෂවල සිදුකරන ලද වරිපනම් තක්සේරු පදනම් කරගෙන වරිපනම් අයකරන බව නිරීක්ෂණය වූ අතර, දේපල සමීක්ෂණ සිදුකර වරිපනම් දේපල සංඛ්‍යාව වැඩිකරගැනීමට කටයුතුකර නොතිබුණි. මේ නිසා මහා නගර සභාවට රැස්කරගත හැකිව තිබූ විශාල වරිපනම් ආදායමක් අහිමිව ගොස් තිබුණි. | ප්‍රවර්තනය වර්ෂයට අදාළ වරිපනම් ආදායම රු.මිලියන 48.2 ක් හා හිග වරිපනම් ආදායම රු.මිලියන 18.3 ක් විය. දැනටමත් ආදායම් පරීක්ෂක මහතුන් විසින් ඒ සම්බන්ධ වාර්තාවක් ආදායම් අනු කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | ආඥාපනත ප්‍රකාරව වරිපනම් තක්සේර කර නව රේටයන් අනුව වරිපනම් අදායම් අයකිරීමටත්, දේපල සමීක්ෂණය මගින් වරිපනම් දේපල වැඩිකර ගැනීමටත් කටයුතු කළයුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.70,222,909 ක් වූ අතර, කාලවිශ්ලේෂණය අනුව වසර 1 ට අඩු, වසර 1 ත් 3 ත් අතර, වසර 3 ත් 5 ත් අතර, වසර 5 ත් 10 ත් අතර හා වසර 10 ට වැඩි කාලයක සිට අයවිය යුතු ශේෂය පිළිවෙලින් රු.8,327,494 ක් රු.23,343,776 ක් රු.14,394,483 ක් රු.18,245,366 ක් හා රු.5,911,790 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බදු ගෙවීම් පැහැර හැර ඇත්තේ මුඩු ඉඩම් යටතේ ඇති දේපල විසිනි. භෞතිකව නොමැති දේපළ බිල් කිරීම් නතර කිරීමට හා හිඟ බදු නිවැරදි කිරීමට කටයුතු කරමි. කාර්ය මණ්ඩලයේ සහායෙන් සහ විධිමත් ක්‍රියාකාරී සැලැස්මකින් හිඟ බදු අය කර ගැනීමට කටයුතු කරමි. | හිඟ වරිපනම් ශේෂ අය කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට ගම්පහ ප්‍රධාන කාර්යාලයේ වසර 5ට වැඩි හිඟ වරිපනම් ශේෂය, වටිනාකම් අනුව විශ්ලේෂණය කළ විට වරිපනම් ඒකකයක හිඟ වටිනාකම රු. 100,000ට වැඩි ඒකක 13ක වටිනාකම රු. 2,340,044 ක්ද, ඒකකයක වටිනාකම රු. 50,000ත් රු. 100,000 ත් අතර වරිපනම් ඒකක 29 ක වටිනාකම රු. 1,938,294 ක් ද, රු. 25,000ත් 50,000ත් අතර වරිපනම් ඒකක 88ක වටිනාකම රු.3,053,932 ක් ද, රු. 25,000ට අඩු වරිපනම් ඒකක 1,127ක වටිනාකම රු. 5,544,250 ක් ද, නිරීක්ෂණය වූ අතර, ඒකක වටිනකම විශාල වරිපනම් ශේෂ පිලිබඳ වැඩි අවධානය යොමුකර අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | රු. 50,000 වැඩි සියළු ශේෂ සම්බන්ධව අදායම් පරීක්ෂක විසින් පරීක්ෂණ සිදුකරගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශිත වාර්තාවක් ආදයම් අනුකමිටුවට යොමුකර අවශ්‍ය ක්‍රියා මාර්ග සඳහා යොමු වී ඇත. | හිඟ වරිපනම් ශේෂ අය කළයුතු වේ. |

2.2.2.බදුකර කුලී

--------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | --------------------- | ------------- |
| (අ) | හිඟ අදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ බදුකර කුලී වටිනාකම රු.4,781,517 ක් සහ වර්ෂය තුල අයකර තිබූ වටිනාකම රු.9,020 ක් වූයෙන් සියයට 99 ක ප්‍රතිශතයක් අයකරගැනීමට පැවති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | ගිවිසුම් අනුව කටයුතු කර හිඟ බදුකර කුලී අය කළයුතු වේ. |
| (ආ) | හිඟ අදායම් වාර්තාව අනුව වර්ෂය තුල බිල්කර තිබුණු බදුකර කුලී වටිනාකම රු.6,909,761 ක් සහ වර්ෂය තුල අයකර තිබූ වටිනාකම රු.2,870,321 ක් වූයෙන්, සියයට 58 ක ප්‍රතිශතයක් අයකරගැනීමට පැවති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | බදුකර කුලී ආදායම් අය කළයුතු වේ. |

2.2.3. **කර්මාන්ත හා ව්‍යාපාර බදු**

------------------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| හිඟ අදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිග වටිනාකම රු.855,590 ක් සහ අයකර තිබුණු වටිනාකම රු.219,400 ක් වූයෙන්, සියයට 74 ක ප්‍රතිශතයක් අයකරගැනීමට පැවති බව නිරීක්ෂණය විය. | හිග ශේෂ සඳහා නඩු පවරා ඇති අතර, අධිකරණ ක්‍රියාවල ප්‍රගතිය අනුව ලේඛන යවත්කාලීන නොවීම නිසා, ශේෂ දක්නට ලැබේ. නඩු විස්තර නාගරික නීති නිලධාරී වෙත ලබා දී ඇති අතර, උපදෙස් අනුව නිවැරදි කරමි. | හිග ශේෂයන් ප්‍රවර්ථන වර්ෂයේම අයකිරීමත් ලේඛන නිවැරදි කිරීමත් කළයුතු වේ. |

2.2.4. **විනෝද බදු**

--------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| හිඟ අදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ ශේෂය රු.5,067,942ක් සහ වර්ෂය තුලදී අයකරගෙන තිබුණු ශේෂය රු.130,254 ක් වූයෙන් සියයට 98 ක ප්‍රතිශතයක් අයකරගැනීමට පැවති බව නිරීක්ෂණය විය. | පබ්ලික් සිනමා ශාලාවේ හිඟ විනෝද බදු රු.5,200,450 ක්, අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත. අනෙක් ඒවාට නෛතික ක්‍රියාමාර්ග ගැනීමට ගොනු ඉදිරිපත් කර ඇත. | හිඟ විනෝද බදු ආදායම අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

2.2.5. **වෙනත් ආදායම්**

-------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| හිඟ අදායම් වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වෙනත් ආදායම් හිඟ ශේෂය රු.92,481,251 ක් වුවත්, වර්ෂය තුල අයකරගත් ශේෂය රු.47,050,116 ක් වූයෙන්, සියයට 49 ක ප්‍රතිශතයක් අයකරගැනීමට පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

### 2.2.6. වෙළඳ බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හිඟ අදායම් වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟ ශේෂය රු.562,661 ක් වුවත්, වර්ෂය තුල අයකරගත් ශේෂය රු.240,233 ක් වූයෙන්, අයකර නොගත් ප්‍රතිශතය සියයට 57 ක් වී තිබුණි. | 2018 වර්ෂයේ රු.24,850 කට හැර අනෙකුත් ශේෂ සඳහා නඩු පවරා ඇති අතර, අධිකරණ ක්‍රියාමාර්ග වල ප්‍රගතිය අනුව ලේඛන යාවත්කාලීන වී නොමැත. | හිඟ වෙළඳ බලපත්‍ර ශේෂ පිළිබඳව ප්‍රවර්ථන වර්ෂයේම නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සහ නිසි බලධාරීන්ගේ අනුමැතිය මත ගිණුම් ශේෂ නිවැරදිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.2.7. නිවාස කුලී

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | හිඟ අදායම් වාර්තාව අනුව, ප්‍රවර්තන වර්ෂය තුල බිල් කළ නිවාස කුලී වටිනාකම රු.306,563 කින් වර්ෂය තුල අයකරගෙන තිබුණ වටිනාකම රු.76,279 ක් වීමෙන් සියයට 75 ක ප්‍රතිශතයක් අයකරගැනීමට කටයුතුකර නොතිබුණ බව නිරීක්ෂණය විය. | වර්ෂය තුල බිල් කළ වටිනාකම වැඩිවී ඇත්තේ නාගරික ගණකාධිකාරිවරයාම කුලී බිල් කිරීම නිසාය. | කුලී හිමියන්ගෙන් හෝ අයකිරීම් පැහැර හරින ලද පාර්ශවයන්ගෙන් හිඟ ශේෂ අයකිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | කුලී හිමියා මිය ගොස් ඇති නිවසකින් වර්ෂ 13 ට වැඩි කාලයක සිට පැවති හිඟ කුලී වටිනාකම රු.54,909 ක් නිරවුල් කර නොතිබුණි. | මිය ගිය අයගේ හිග ශේෂයන් කපා හැරීමටද, හිග ශේෂ අයකර ගැනීමද කටයුතු කරමි. | හිඟ ශේෂ නිරවුල් කළ යුතුය. |

### 2.2.8. වෙළඳ ස්ථාන කුලී

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති හිගහිටි වෙළඳ ස්ථාන කුලී ශේෂය රු.29,902,189 කින් වර්ෂය තුලදී අයකළ වටිනාකම රු.12,981,050 ක් වීමෙන් අයකර නොගත් ප්‍රතිශතය සියයට 57 ක් වී තිබුණු අතර, වර්ෂය තුල බිල් කර තිබුණු වටිනාකම රු.33,010,159 කින් අයකර තිබුණු වටිනාකම රු.21,861,369 ක් වීමෙන් සියයට 34 ක ප්‍රතිශතයක් සමාලෝචිත වර්ෂය තුල අයකර ගෙන නොතිබුණි. | හිග මුදල් ගෙවීම සඳහා දැනුම් දීමෙන් අනතුරුව නොගෙවන ලද වෙළඳ ස්ථාන මුද්‍රා තැබීම සඳහා කටයුතු කර ඇත. | කුළී හිමියන්ගෙන් හෝ අයකිරීම් පැහැර හරින ලද පාර්ශවයන්ගෙන් හිඟ හිටි කුළී අයකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ගම්පහ කාර්යාල බල ප්‍රදේශයේ කඩ කාමර 437 කින් රු.24,824,956 ක් අයවීමට පැවති අතර, එහි කාල විශ්ලේෂණය අනුව, හිඟව පැවති කාලය වසර 5 ත් 10 ත් අතර කඩ කාමර 38 කට අදාලව හිඟ ශේෂය රු. 6,452,259 ක් ද, වසර 03 ත් 05 ත් අතර කඩ කාමර 40 කට අදාලව හිඟ ශේෂය රු. 1,374,022 ක් ද වසර 01ත් 03ත් අතර කඩකාමර 71 කට අදාලව හිඟ ශේෂය රු.7,805,488 ක් ද වසර 01ට අඩු කඩ කාමර 288 කට අදාලව හිඟ ශේෂය රු.9,193,227 ක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නොගෙවන ලද වෙළඳ ස්ථාන මුද්‍රා තැබීමට කටයුතු කර ඇත. ඉදිරියේදී හිග මුදල් අයකර ගැනීමට අයකර ගැනීමට කටයුතු කරමි . | කඩ හිමියන්ගෙන් හෝ අයකිරීම් පැහැර හරින ලද පාර්ශවයන්ගෙන් හිග මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | යක්කල උප කාර්යාලයට අයත් කඩ කාමර 12 ක රු.225,525 ක හිඟ ශේෂයක් අයකරගැනීමට පැවතුණි. | පිළිතුරු ලබාදී නොමැත. | කඩ හිමියන්ගෙන් හෝ අයකිරීම් පැහැර හරින ලද පාර්ශවයන්ගෙන් හිග ශේෂ අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කඩකාමර 221 ක හිඟ කඩ කුලී රු.6,281,610 ක් ජර්නල් සටහනක් නොමැතිව කඩකුලී ආදායම ගිණුම්ගත කරන අවස්ථාවේදීම ආදායමින් අඩුකර, සාවද්‍ය ලෙස ගිණුම්ගත කරමින් කපාහැර තිබුණු අතර ඒ සඳහා මහා නගර සභා ආඥා පනතේ 266(අ) වගන්තිය පරිදි, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | නිසි අනුමැතියක් නොමැතිව කපාහරින ලද හිඟ හිටි ආදායම් නැවත ගිණුම්ගත කළයුතු අතර, කපා හැරීම් ජර්නල් සටහන් මගින් ගිණුම්ගත කළ යුතුය. |

2.2.9. **ටෙන්ඩර් දේපල ආදායම්**

-------------------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ටෙන්ඩර් දේපල ආදායම් ලේඛනය අනුව, වාර්ෂික ටෙන්ඩර් ප්‍රදානය කරනු ලබන ටෙන්ඩර් දේපොල 6 ක 2017, 2019 සහ 2020 වර්ෂවල සිට පවතින රු.1,205,250 ක හිඟ ආදායම 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | රු.1,205,205 ක් වූ දේපල 3 කට නඩු දැමීමද, රු.516,518 ට දේපල 2 කට නීති නිලධාරිට ඉදිරිපත් කිරීමද, රු.30,409 ක එක් දේපලකට එන්තරවාසි යැවීමට අනුමත කර ගෙන ඇත. | හිඟ ටෙන්ඩර් දේපල ආදායම් ටෙන්ඩර් දේපල හිමියන්ගෙන් හෝ අයකිරීම් පැහැර හරින ලද පාර්ශවයන්ගෙන් අයකිරීමට කටයුතු කළ යුතුය. |

2.2.10. **තානායම් කුලී**

**-----------------**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තානායම් ගාස්තු ලේඛනය අනුව, 2021 දෙසැම්බර් 31 දින වන විට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු හිඟ තානායම් කුලී වටිනාකම රු.5,954,355 ක් අයකරගෙන නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් තානායම පවරා ගෙන ඇත. හිග ශේෂ පියවීමට කටයුතු කරමි. තානායම යලි නගර සභාව වෙත පවරා ගැනීම සදහා කටයුතු කරමින් පවතී. | හිඟ තානායම් ගාස්තු නාගරික සංවර්ධන අධිකාරියෙන් හෝ අයකිරීම් පැහැර හරින ලද පාර්ශවයන්ගෙන් අයකිරීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

මහා නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**-----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 වර්ෂයේ කසල බැහැර කිරීමේ ටෙන්ඩරය සඳහා 2021 අප්‍රේල් 19 දින රැස්වුණු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින්, දඹුවවත්ත කසළ බැහැර කරන ස්ථානයෙහි සෞඛ්‍යාරක්ෂිත බව හා මහජන පීඩාවන් පිළිබඳව තහවුරුකර ගැනීමක් කලයුතු බවට නිර්දේශකර තිබුණි. 2021 අප්‍රේල් 21 දින සහ 2021 මැයි 19 දින දරන මහජන පරීක්ෂකවරුන්ගේ වාර්තා අනුව, පරිසර බලපත්‍රයක් ලබාගෙන නොමැතිවීම, නොදිරන කසල කඳු පැවතීම, අංගණය ආවරණය කර නොමැතිවීම සහ කසල ප්‍රතිචක්‍රිකරණය නොමැතිවීම යන හේතු නිසා සෞඛ්‍ය ආරක්ෂිත බව හා මහජන පීඩාවන් සම්බන්ධයෙන් දඹුවවත්තට කසළ බැහැර කිරීම නිර්දේශ කළ නොහැකි බව දන්වා තිබුණි. එසේ තිබියදී මෙම ස්ථානයට කසළ දැමීමට නාගරික කොමසාරිස් විසින් සභාවට කරුණු ඉදිරිපත් කර තිබුණි. | ගම්පහ මහාධිකරණ 2015 පෙබරවාරි 13 දිනැති නඩු අංක ප්‍රතිශෝධන 10/15 මගින් ලබා දී ඇති තීන්දු පරිදි, දඹුවවත්තට කසල බැහැර කර ඇත. මෙම ඉඩම විශාල වීම, ආසන්නයේ නිවාස හෝ ජල මූලාශ්‍ර නොමැති වීම, කසල ප්‍රවාහනය කිරීම ටෙන්ඩර්කරු විසින් සිදුකිරීම, බැහැර කරන කසල ලෝඩ් ප්‍රමානය සඳහා ගෙවීම් සිදු කිරීම. කෙරවලපිටිය කසල උද්‍යානය වෙත කසල බැහැර කිරීම් සඳහා ඉන්ධන අතිකාල දීමනා ආදිය ගෙවීම් කලයුතු වීම, ප්‍රමානවත් තරම් ටිපර් රථ නොමැති වීම මත දඹුවවත්ත කසල අංගනය වෙත කසල බැහැර කර ඇත. කෙරවලපිටියට මසකට රුපියල් ලක්ෂ විස්සක හිඟ මුදල් ගෙවා කසල බැහැර කිරීමටද වියදම් කළයුතු වීම සහ දඹුවවත්තට කසල බැහැර | කසළ උපයෝගී කරගෙන කොම්පෝස්ට් නිපදවා, ආදායම් උත්පාදනය කරගැනීමට කටයුතු කළයුතුය. |

| | |
|---|---|
| තවද කෙරවලපිටිය කසළ අංගනයට කසළ බැහැර කිරීම වෙනුවෙන් , රු.12,728,244 ක් ගෙවියයුතුව තිබුණු අතර, 2021 වර්ෂයේදී තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ නොකල දඹුවවත්ත කසළ අංගනයට කසල බැහැර කර ඒ සඳහා රු.12,664,000 ක් වියදම් කර තිබුණි. | කිරීමට මාසිකව රුපියල් ලක්ෂ දහයක් පමණක් වැය වීම නිසා දඹුවවත්තට කසළ බැහැර කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නගර සභා ප්‍රධාන කාර්යාලය සඳහා සූර්ය බල පද්ධතිය ස්ථාපිත කිරීම | | |
| ජාතික තරඟකාරී ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමේදී ලැබී තිබුණ ආයතන දෙකින් එක් ආයතනයක් විදේශීය ගුවන් ටිකට්පත් අලෙවි නියෝජිත ආයතනයක් බව සහ ලංසු ලියකියවිලිවල ආයතනයේ ලිපිනය, මුද්‍රාව හෝ ආයතනයේ නම සඳහන්වී නොතිබුණ බව නිරීක්ෂණය වුවත්, ටෙන්ඩර් මණ්ඩලය හා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් මෙම ආයතනයේ මිල ගණන් සලකා බලා තිබුණි. ගිවිසුම අනුව 2021 සැප්තැම්බර් 21 දින වන විට නිම කළයුතුව තිබුණු මෙම ව්‍යාපෘතිය අවසන්ව නොතිබුණද, 2022 ජූනි 28 දිනෙන් පසුව කාර්ය සාධන ඇපකරයේ දින දීර්ඝකර නොතිබුණි. ව්‍යාපෘතිය මගින් මාසික විදුලි බිල ඉතිරි වන බව සලකා 2022 වර්ෂයේ විදුලි වියදම සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණද ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් 2021 ඔක්තෝබර් මස සිට 2022 සැප්තැම්බර් මස දක්වා රු.2,624,659 ක් විදුලි බිල ලෙස ගෙවා තිබුණි. තවද 2021 නොවැම්බර් 09 දින ස්ථාවර තැන්පත් සහතිකයක් ඇපයට | මිළ ගණන් ලැබී තිබූ ආයතන 02 න් යුරෝපා සෝලාර් එනර්ජි පුද්ගලික ආයතනය, බ්‍රයිට් ටුවර් පුද්ගලික ආයතනය ලෙස ලියාපදිංචි කර තිබුණද, යුරෝපා සෝලර් එනර්ජි පුද්ගලික ආයතනය මිළ ගණන් ඉදිරිපත් කර ඇත. 2022 සැප්තැම්බර් 30 දක්වා කාලය දීර්ඝ කිරීමට අදාල කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම ඇත. | ලංසු කැඳවීමේදී පූර්ව සුදුසුකම් තක්ෂණික ඇගයීම් කමිටුවෙන් අනුමත කරගත යුතු අතර , ලංසු ඇගයීමේ දී ප්‍රසම්පාදන ක්‍රමයට අනුකූල විය යුතු අතර ගිවිසුම් ගත කාලසීමාව තුල ව්‍යාපෘති අවසන්කර ගැනීමත්, එමගින් කාර්යාල විදුලි බිල අඩුකර ගැනීමත් කාර්ය සාධන ඇපකරයේ දින දීර්ඝකරවා ගැනීමත් ඕනෑම ගෙවීමක් සිදුකිරීමේදී ගෙවීම් පටිපාටිය අනුගමනය කිරීමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තබා සභාව විසින් ඉල්ලා තිබුණු රු.5,500,000 ක ණය මුදලෙහි වාරික මුදල රු.1,650,000 ක් අත්තිකාරම් හෝ කළ වැඩ සඳහා ගෙවීමක් ලෙස හදුනාගෙන ගෙවීම් වවුචරයක් මගින් ගෙවීම් සිදු නොකර, එදිනම ණය ලබාගත් බැංකුව විසින්, ශිල්පසුම්ගත ආයතනය වෙත ගෙවා තිබුණි. | | |

(ආ) යක්කල සාප්පු සංකීර්ණයේ කඩ කාමර ටෙන්ඩර් කිරීම

| | | | |
|---|---|---|---|
| (i) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීමට යෝජනා කරන ලද, යක්කල සාප්පු සංකීර්ණය සඳහා රු.201,419,246 ක ඇස්තමේන්තුව 2008 ජුනි 13 දින සභා සම්මත කර තිබුණද, ඉදිකිරිම සඳහා ප්‍රතිපාදන සපයා ගැනීම පිළිබඳව නිශ්චිතව කරුණු දක්වා නොතිබීම හේතුවෙන්, සැලැස්ම සකස්කර වසර 12 ක් ඉක්මවී ගියද, අවසන් කිරීමට නොහැකිවී තිබුණි. | සභාවේ මුදල් අර්බුදය නිසා ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී අවසන් කර, නැවත 2020 වර්ෂයේ ආරම්භ කර කොරෝනා වසංගත තත්ත්වය හා ඉන්ධන අර්බුදය හේතුවෙන් ප්‍රමාද වුවද, මේ වන විට අවසන් අදියරේ පවතී. | ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කළයුතුය. |
| (ii) | යක්කල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 103 ක් ඉදි කිරීමට යෝජනා වී තිබුණු අතර ඉදි කිරීමෙන් අනතුරුව බදු දීම සඳහා එක් එක් කඩ කාමරය සඳහා අවම ලංසුවක් තීරණය කර 2008 අගෝස්තු 13 දින ටෙන්ඩර් කැඳවා තිබුණි. මෙහිදී කඩ 41 ක් සඳහා මිල ගණන් ලැබී නොතිබුණි. 2014 ජූනි 16 දින නැවත මිල ගණන් කැඳවා තිබුණද, කඩ කාමර 41 සඳහාම මිල ගණන් කැඳවිය යුතු වුවත් ඒ අතරින් කඩ කාමර 15 ක් පමණක් තෝරාගෙන තිබුණි. කඩ කාමර 26 ක් සඳහා දෙවනවර මිල ගණන් කැඳවා නොතිබීම හේතුවෙන් 2014 ජුලි 11 දින සභා තීරණයට අනුව අවම ලංසුවට තීරණය වී තිබුණි. | 2008 වර්ෂයේදි පළමුවර ටෙන්ඩර් කිරිමේදි කඩ අංක 34,41,42 ,44,46 හා 48 සඳහා මිල ගණන් ඉදිරිපත් කළද ඒ සඳහා මුදල් ගෙවා කඩ කාමර ලබා ගෙන නොමැති බැවින් නැවත මිල ගණන් කැඳවා තිබුනි. | මිල ගණන් නොලද කඩ කාමර 41 සඳහා පමණක් දෙවනවර මිල ගණන් කැඳවිය යුතුය. |
| (iii) | හිඟ පෙර මුදල් පවතින කඩ | විවිධ හේතූන් මත මෙම ව්‍යාපෘතිය ප්‍රමාද විම | ප්‍රසම්පාදන |

| | | | |
|---|---|---|---|
| | කාමර 22 ක් සභාවට පවරාගෙන නව තක්සේරුවක් යටතේ නැවත ටෙන්ඩර් කැඳවා බදු දීමට කටයුතු කළ යුතු වුවත්, එකම කඩ කාමරය අවස්ථා කීපයකදී විවිධ පුද්ගලයන්ට සභා තීරණ හා දිවුරුම් ප්‍රකාශන මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව පවරා දී තිබුණි. | මත ගිවිසුම් ගත පාර්ශවයන්ට කඩ කාමරයක් ලබා දීමට නොහැකි වීමත්, යලි මුදල් ලබාදීමේ හැකියාවක් නොමැතිවීමත් නිසා, මුදල් වල අයිතිය පැවරීමට අවසර ලබා දී, ඒ වෙනුවෙන් රු. 5,000 ක් අය කර, පැවරීමට සභාව තීරණය කර, ඒ අනුව කටයුතු කර ඇත. | මාර්ගෝපදේශය අනුව නැවත ටෙන්ඩර් කැඳවා උපරිම මිලට බදු දීම කළයුතුය. |
| (iv) | පෙර මුදල් එකවර ලබාගෙන ඒ අනුව ගිවිසුම්ගත නොවීම හේතුවෙන් 2008 වර්ෂයේ සිට 2021 නොවැම්බර් මස දක්වා කඩ කාමර 39 කින් රු.57,355,771 ක පෙර මුදල් හිඟයක් ඇතිවී තිබුණු අතර, එයින් කඩ කාමර 28 ක රු.55,991,842 ක හිඟයක් 2022 අගෝස්තු 30 දින වනවිටත් අයකරගෙන නොතිබුණි. | 2021 වසරේදි කඩ 39 ක හිඟයක් පැවතියද මේ වන විට කඩ කාමර 10 ක පමණක් හිඟයක් ඇත. | පෙර මුදල් එකවර ලබාගෙන ගිවිසුම් ගතවී කඩ කාමර ඉදිකර බදු දීම කළයුතු විය. |
| (v) | 2021 නොවැම්බර් 30 දිනට, පෙර කඩ හිමියන් 10 දෙනෙකු සිටි නමුත්, කඩ කාමර 16 ක් වෙන්කර තිබීමෙන්, කඩ කාමර 06 ක් වැඩිපුර වෙන්කර තිබූ බවත්, එම කඩ කාමර තක්සේරුවක් කර නොමැති බවත්,2021 නොවැම්බර් 30 දින වන විටත් පෙර මුදල් අයකර කඩ කාමර ලබා දී නොතිබුණ බවත් නිරීක්ෂණය විය. | 2022 වර්ෂය වන විට සියලු කඩ කාමර සඳහා තක්සේරුව සිදු කිරිමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. | නව තක්සේරුව සිදුකරවාගෙන නව රේටයන් මත ගිවිසුම්ගතව බදු දීමට කටයුතු කළයුතුය. |
| (vi) | 2008 වර්ෂයේ තක්සේරු කිරීමකින් හෝ ටෙන්ඩර් කිරීමකින් තොරව, 2012 අගෝස්තු 24 දින කඩ කාමර අංක 54, ප්‍රදානයකර, 2016 ජූලි 21 දින වෙනත් පුද්ගලයෙකුට පවරා දී, 2017 පෙබරවාරි 07 දින ගිවිසුම් ගතවී පෙර මුදල් ලෙස රු.1,560,000 ක් අයකර තිබුණි. | 2008 දි 54 කඩ කාමරය ටෙන්ඩර් නොකිරිම ගැන ගොනුවේ තොරතුරු නොමැති කඩ කාමරය සඳහා ආදායම් පරික්ෂකගේ තක්සේරුව 156,000 ක් ලෙස ලබා දී ඇත | විධිමත් තක්සේරුවක් ලබාගෙන ටෙන්ඩර් කර ගිවිසුම් ගතවී කඩ කාමර බදු දීම කළයුතුය. |

| | | |
|---|---|---|
| (vii) 2008 වර්ෂයේ දී සාප්පු සංකීර්ණය රු.201,419,246 ක ඇස්තමේන්තුවකට අනුමතකර, 2020 වර්ෂය දක්වා නිම නොකිරීම හේතුවෙන්, 2020 වර්ෂයේදී ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු.165,837,207 කට එනම් මූලික ඇස්තමේන්තුවෙන් සියයට 82 කට සමාන වූ අතුරු ඇස්තමේන්තුවක් සකස්කර තිබුණි. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. | කාලප්‍රමාදයන් ඇති නොවන පරිදි ඇස්තමේන්තුගත වටිනාකමට ඉදිකිරීම් කළ යුතුය. |
| (viii) 2019 ජූලි 18 දින සභා තීරණ මසතී/26/2019 අනුව අවම ලංසුවට බිම් මහල වර්ග අඩියක් රු.15,000 ක්ද, පළමු මහල රු.7,500 ක්ද, දෙවන මහල රු.3,250 ක්ද බැගින් තක්සේරුවක් සිදුකර තිබුණද මෙම තක්සේරුව නොසලකාහැර 2008 අවම තක්සේරුවට 2021 වර්ෂයේදී කඩ කාමර 15 ක් සඳහා පමණක් පෙර මුදල් අයකර තිබීමෙන් සභාවට රු.7,335,000 ක පාඩුවක් සිදුකර තිබුණි. | අවම ලංසුවට මිල ගණන් කැඳවීම සඳහා ගරු නගරාධිපතිතුමා විසින් කටයුතු කර ඇත. | නව කාලීන තක්සේරුවක් කර ටෙන්ඩර් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ix) 2021 ජනවාරි 18 දින පෙර මුදල් හිග කඩ හිමියන්ගේ කඩ පවරාගෙන, අවම ලංසුවට ටෙන්ඩර්කර කඩ කාමර ප්‍රදානය කිරීමට තීරණයකර තිබියදී, ඊට පටහැනිව නගරාධිපතිවරයාගේ මුහුණු පොතේ සටහනක් තැබීමෙන් කඩ කාමර 09 ක් ප්‍රදානයකර තිබුණි. | අවම ලංසුවට මිල ගණන් කැඳවීම සඳහා ගරු නගරාධිපතිතුමා විසින් කටයුතු කර ඇත. | නව කාලීන තක්සේරුවක් කර ටෙන්ඩර් කිරීමට කටයුතු කළ යුතුය. |

(ඇ) දේපල ප්‍රත්‍යාගණනය නොකිරීම

| | | |
|---|---|---|
| 2021 වර්ෂයේ සභාව සතු ටෙලර් 16 ක්, සුසාන භූමි 07 ක් අනෙකුත් ඉඩම් 3 ක් සහ ඡායා පිටපත් යන්ත්‍ර 2 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කර දේපළ පිරියත හා උපකරණ ගිණුමට ඇතුළත් කරමි. | අදාල වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළයුතුය. |

## 3.3. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) බඳවා ගැනීම්** | | |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 හා 2019 සැප්තැම්බර් 18 දිනැති චක්‍රලේඛය පදනම්ව වැඩ/ක්ෂේත්‍ර කම්කරුවන් 37 දෙනෙකු හා සෞඛ්‍ය කම්කරුවන් 22 දෙනෙකු බඳවාගෙන තිබුණි. 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 හි අංක 05 වගන්ති අනුව අදාල පත්වීම් ලබා දීමෙන් පසුව කාර්ය මණ්ඩලය යාවත්කාලීන කිරීම සඳහා, කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නොපමාව වාර්තා කලයුතු බව දක්වා ඇතත්, කාර්ය මණ්ඩලය යාවත්කාලීන කර නොතිබුණි. ඒ හේතුවෙන් ගම්පහ මහා නගර සභාව විසින් එම සේවකයන් සඳහා 2020 වර්ෂය සඳහා වැටුප් ලෙස රු.24,081,350 ක්ද 2021 වර්ෂය සඳහා රු.23,666,750 ක්ද, 2022 අප්‍රේල් 30 දිනට රු.8,345,050 ක් ලෙස එකතුව රු.56,093,150 ක් ගෙවා තිබුණු අතර එම වියදම සභා අරමුදලට වැය බරක් වී තිබුණි. | 29 / 2019 චක්‍රලේඛයට අනුව බඳවාගත් සේවකයින් 59 දෙනා අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇතත්, මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත. අනුමැතිය ලබා ගැනීම සඳහා නැවත ලිපි යවා ඇත. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් කාර්ය මණ්ඩලය යාවත්කාලීන කරවා ගත යුතුය. |
| **(ආ) සේවක ණය** | | |
| ස්ථාන මාරුවීම්, විශ්‍රාම යාම සහ වෙනත් ආයතනවලට අනුයුක්ත වීම වැනි හේතු නිසා අයවීම් හිඟ හිටි ශේෂ, වසර 1 ත් 3 ත් අතර නිලධාරීන් 6 දෙනෙකුගේ රු.328,234 ක් හා වසර 10 ට වැඩි නිලධාරීන් 47 දෙනෙකුගේ රු.351,369 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණු අතර, වසර 10 ට වැඩි ශේෂය තුල පැවති ලංකා විදුලිබල මණ්ඩලයට අනුයුක්ත කළ සේවකයන් 07 දෙනෙකුගෙන් අයවියයුතු රු.35,170 ක් සහ විශ්‍රාම | හිග හිටි ශේෂ කාල විශ්ලේෂණයට අනුව වසර 1 ත් 3 ත් අතර ශේෂයෙන් රු.260,169 ක් මේ වන විට අය කර ගෙන ඇත. වසර 10 ට වඩා වැඩි ශේෂයෙන් රු.53,780.90 ක් ද අය කර ගෙන ඇත. සේවකයන් 07 දෙනෙකුගෙන් අය විය යුතු රු35,170 මුදල අය කර ගැනීමට ලිපි යොමු කර ඇත. විශ්‍රාමික සේවකයන්ගේ ශේෂ අය කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

ගොස් තිබූ සේවකයන් 34 දෙනෙකුගෙන් අයවියයුතු රු.262,417 ක්ද, 2022 ඔක්තෝබර් 05 දින වනවිටත් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.4. **වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සභාව සතු සුසාන භූමි 14 න් වටිනාකම රු.539,182,170 ක් වූ සුසාන භූමි 10 ක සහ ඉඩම් 35 න් වටිනාකම රු.1,286,624,700 ක්වූ ඉඩම් 6 ක අයිතිය තහවුරු කිරීමට නීත්‍යානුකූල ලියවිලි සකස්කරගෙන නොතිබුණි. | ඉඩම් හා සුසාන භූමි, ප්‍රකාශන ඔප්පු සැකසීම සඳහා, මැනීම් කටයුතු කරගෙන යන අතර, මනින ලද ඉඩම් හා සුසාන භූමි සඳහා ප්‍රකාශන ඔප්පු සැකසීම මේ වන විට සිදු වෙමින් පවතී. | අයිතිය තහවුරු කිරීමට නීත්‍යානුකූල ලියවිලි සකස් කරගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මහා නගර සභාව සතුව පවතින මාර්ග ප්‍රමාණය 2,249 ක් වුවද ඒවා ගැසට් කර පවරාගැනීමටත් පිඹුරුපත් සකස් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛය අනුව මැනීම් කටයුතු නවතා ඇති අතර, මාර්ග ගැසට් කිරීමට ප්‍රතිපාදන ලද වහාම කරන බව දන්වමි. | මාර්ග ගැසට්කර සභාවට පවරා ගැනීමටත් පිඹුරුපත් සකස් කිරීමටත් කටයුතු කළයුතුය. |
| (ඇ) 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව, ධාවනයෙන් ඉවත් කර වසර තුනක් පමණ ගතවී ඇති ට්‍රැක්ටරය, 2021 ජනවාරි වලින් පසු ධාවනයෙන් ඉවත්කර ඇති ත්‍රී රෝද රථය සහ මාර්ග කම්පන තලනයක් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස දක්වා තිබුණද, මු.රෙ. 770 ප්‍රකාරව කටයුතුකර නොතිබීම හේතුවෙන් ඒවායේ වටිනාකම තවදුරටත් අඩුවන බව නිරීක්ෂණය විය. | පිළිතුරු ඉදිරිපත්කර නොමැත. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශය ප්‍රකාරව කටයුතු කළයුතුය. |

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

### විගණන නිරීක්ෂණය

------------------------------

2003 වර්ෂයේදී මඩමවත්ත ගෘහස්ථ අත්පන්දු ක්‍රීඩාංගනය සඳහා සභා අරමුදලින් රු.5,230,606 ක් වැයකර තිබුණද, වැඩ අවසන් කර නොතිබුණු අතර, 2011 වර්ෂයේදී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් මෙම ඉදිකිරීම ප්‍රයෝජනයට ගත නොහැකි බවත් ඇතැම් ඉදිකිරීම් දිරාපත්ව ඇති බවත් වාර්තා කර තිබුණි. එම නිර්දේශය නොසලකා දිරාගිය ඉදිකිරීම් ඉවත්කිරීමකින් තොරව, 2019 සැප්තැම්බර් 30 දින සිට 2020 දෙසැම්බර් 15 දක්වා කාලය තුල කසළ හුවමාරු මධ්‍යස්ථානයක් ඉදිකර රු.8,840,741 ගෙවීම් කර තිබුණු අතර කසළ හුවමාරු මධ්‍යස්ථානය සංවර්ධනය කර මසක් ගතවූ 2021 ජනවාරි මස 14 දින එම පරිශ්‍රය වොලිබෝල් ක්‍රීඩා පිටියක්, ළමා උද්‍යානයක් හා නාගරික උද්‍යානයක් ආදීන්ගෙන් සමන්විත ව්‍යාපෘතියක් සඳහා ලබාදීමට සභා අනුමැතියකින් තොරව 2021 නොවැම්බර් 05 දිනැති ගමනස/නාඉ01/04/2021 ලිපිය මගින් නගරාධිපතිවරයා විසින් එකඟ වී තිබුණි. ඒ අනුව 2003 වර්ෂයේ රු.5,230,606 ක මුදලක් වැය කර සිදුකල ඉදිකිරීම් හා 2019 වර්ෂයේ රු. 8,840,741 ක් වැයකර සිදුකරන ලද ඉදිකිරීම් එකතුව වන රු.14,071,341 ක් වූ මුදල සභා අරමුදලින් කරන ලද නිෂ්කාර්යය වියදමක් බව නිරීක්ෂණය විය.

### සභාවේ අදහස් දැක්වීම

--------------------------

මඩමවත්ත ගෘහස්ත ක්‍රීඩාංගනය ඉදිකිරීම් කටයුතු නැවත්වීම හේතුවෙන් හිස් වූ භූමිය 2019 වර්ෂයේ සිට කසළ අංගනයකට සුදුසු පරිදි සකසා කසළ හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කරයි. සියත උයන ව්‍යාපෘතිය ප්‍රයෝජනවත් හා කාලෝචිත ව්‍යාපෘතියක් බැවින් කසල අංගනය හා කසල හුවමාරු මධ්‍යස්ථානය මෙම ස්ථානයෙන් ඉවත් කර වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපිත කොට නව ව්‍යාපෘතිය සඳහා භූමිය ලබා දීමට නගර සභාව විසින් එකඟ විය.

### නිර්දේශය

-------------

දිරාගිය ඉදිකිරීම් ඉවත් කිරීම සහ විශාල වියදමක් දරා සකස් කරන ලද කසළ හුවමාරු මධ්‍යස්ථානය, කසළ හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කළයුතුය. සංවර්ධන කටයුතු සිදු කිරීම්දී නගර සංවර්ධන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය.

## 3.6 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2005 සිට 2015 දක්වා සේවය කළ ව්‍යාපෘති සේවකයන් 37 දෙනෙකුට, අර්ථසාධක අරමුදල් පනතේ 10(1) හා 10(2) අනුව සේවකයන්ගෙන් හා සේවායෝජකන්ගෙන් අර්ථසාධක අරමුදලට ගෙවියයුතු පිළිවෙලින් රු.1,432,826 ක් සහ රු.2,149,239 ක් සමග ගෙවීම පැහැරහැරීම හේතුවෙන් අධිභාර මුදල රු.1,791,032 ක් ලෙස එකතු වටිනාකම රු.5,373,097 ක් සභාව විසින් ගෙවියයුතුව තිබුණි. මෙයින් රු.2,742,757 ක් 2022 ජුනි 30 වනවිට සභා අරමුදලින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් සභාව විසින් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට 2022 අගෝස්තු 31 දින වනවිටත් කටයුතුකර නොතිබුණි. තවද මෙම සේවකයින් වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල වන රු.1,904,229 කින් රු.648,463 ක් 2022 ජූලි 30 වනවිට ගෙවා තිබුණද, රු.1,255,765 ක් සභාව විසින් ගෙවිය යුතුව තිබුණි. | ඉදිරියේදී මේ පිළිබඳව අවශ්‍ය තොරතුරු සපයාගෙන ඒ සම්බන්ධයෙන් වගකිව යුතු අයගේ තොරතුරු සනාථ කරගෙන ඒ පිළිබඳව ඉදිරි කටයුතු කිරීමට පියවර ගනිමි. | වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් මු.රෙ. 156 ට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) විදුලි බිල් නිසි කලට වේලාවට නොපියවීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.295,958 ක් ගෙවීමට සිදුව තිබුණු අතර, එයින් රු.104,343 ක් 2021 නොවැම්බර් 24 දින ගෙවා තිබුණි. | මෙය ඉවත් කිරීමට ලංකා විදුලි බල මණ්ඩලයයෙන් ඉල්ලීම් කළද ප්‍රතික්ෂේප කර ඇති බැවින් සභා තීරණයක් ගෙන ගෙවීම් කර ඇත. | බිල්පත් නියමිත දිනට ගෙවීම් කළයුතු අතර, ගෙවීම් පැහැර හැරීමට වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන මු.රෙ. 156 අනුව කටයුතු කළ යුතුය. |

3.7 **ප්‍රසම්පාදනය**

**---------------**

**ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අනුමත ප්‍රසම්පාදන සැලැස්මකට අනුව ප්‍රසම්පාදන කටයුතු කළයුතුය. |